# ජාතික ගොවි කටයුතු නියැදි සමීක්ෂණය

**කෘෂිකාර්මික කටයුතු සැලසුම් කිරීමේදී හා තක්සේරු කිරීමේදී රජයට ප්‍රයෝජනවත් වන තොරතුරු රැස්කිරීම සමීක්ෂණයේ අරමුණය. මෙය ගොවි මහතුන්ගේ ප්‍රයෝජනය පිණිසම කෙරෙන්නක් බව පුන පුනා කිවයුතු නොවේ.**

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි
එච්. ඒ. රන්බණ්ඩා
විසිනි.

''මේ මහත්තයා සති දෙකකට වරක් අපි හමු වෙනවා. ආණ්ඩුවේ මහත්තයෙක් කියල අපේ ගම්වලට එන්නේ මහත්තයා විතරයි මං හිතන්නේ. මේක එසේ මෙසේ කන්දක්යැ. හැතැක්ම තුනක්ම පයින් එන්න ඕනැ. බස් එක නැත්නම් හැතැක්ම අටක්. ආන්ඩුවේ කන්තෝරුවලට යන එකත් ලේසි පාසු වැඩක් නෙවෙයිනේ. ආණ්ඩුවේ කන්තෝරු වලින් කර ගන්න ඕන රාජකාරි ගොඩක් මේ මහත්තයාගේ මාර්ගයෙන් මං කර ගත්තේ. වෙන එකක් තියා අපිට ගොවි හැඳුනුම් පත්‍රයක් ගන්න ඉල්ලුම් පත්‍රයක් ගෙනත් දුන්නෙත් මේ මහත්තයා. මහත්තයා එන කොට අපි දන්නවා අද කියන්න ඕන තොරතුරු මොනවද කියලා.

## අරමුණ

ඉස්සර වෙලා නම්, අපි ඇත්තටම බයවුනා එයා අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න. මේක අපේම හොඳට කරන සමීක්ෂණයක් කියල තේරුම් ගන්න වැඩි කලක් ගියේ නැහැ. සමහර විස්තර තොරතුරු අපිට මුල් කාලයේ මතක තිබුනේ නැහැ. ඉතින් මතක් කර ගන්න සෑහෙන කාලයක් ගියා. දැන්නම් අපි සමහර තොරතුරු ලියලම තියා ගන්නවා. මේ මහ කන්නයේ වැඩ කටයුතුවලට ගත වෙච්ච මිනිස් දිනයි, යොදපු පොහොර, බෙත් ප්‍රමාණයයි, වියදම් වෙච්ච මුදල් ප්‍රමාණයයි මේ පොතේ ලියල තියනවා. අපි වැරදි තොරතුරු දුන්නම් ඒකෙ අවාසිය අපටමයි. අපි වැඩියෙන් කියන්න ඕනෙත් නැහැ, අඩුවෙන් කියන්න ඕනෙත් නැහැ. තියෙන තත්වය කියපුවා ම අපිටත් හොඳයි' ඒ මහත්තුරුන්ටත් හොඳයි.'' රත්නපුර දිස්ත්‍රික්කයෙන් ජාතික ගොවිකටයුතු නියැදි සමීක්ෂණයට තෝරා ගත් එක් ගොවි මහතෙක් අදහස් පළ කළේ එහෙමයි.

මෙම සමීක්ෂණයේ අරමුණ හා සංවිධාන රටාව ගැන අපේ සමීක්ෂණයට තෝරා ගත් සමහර ගොවී මහත්වරුන්ට අවබෝධයක් නැහැ. ඉතාම වැදගත් ජාතික කාර්යයකට අවශ්‍ය විස්තර තොරතුරු සැපයීමෙන් තමන් විශාල මෙහෙයක් ඉටු කරන බව ඔවුන් නොදන්නවා ඇති. මෙම කෙටි ලිපියෙන් බලාපොරොත්තු වෙන්නේ මෙම සමීක්ෂණයේ අරමුණ හා සංවිධාන ව්‍යුහය ගැනත්, ගොවි මහතුන්ට අවබෝධයක් ලබාදීමෙන් සමීක්ෂණය ගැන පහළ වී තියෙන දුර්මත හා නොමනා බිය පහ කිරීමටයි.

පළමුවෙන් මෙම සමීක්ෂණය සඳහා ගොවි මහතුන් තෝරා ගත්තේ කොහොමද කියල බලමු. කෘෂි පාරිසරික විද්‍යාඥයින් විසින් ලංකාව කෘෂි පාරිසරික අංශ හතක් ලෙස වර්ග කොට තියෙනවා. මෙහිදි පරිපාලන දිස්ත්‍රික්ක වර්ග කිරීමද උපයෝගී කර ගැනීමෙන්, පරිපාලන දිස්ත්‍රික්කයක් තුළ සමාන කෘෂි පාරිසරික තත්වයන්ගෙන් යුත් ගම් සමූහයකින් යුත් ප්‍රදේශ ඒකක ස්තරයක් ලෙස සළකා තිබෙනවා. ශ්‍රී ලංකාවේ සම්පූර්ණ බිම් ප්‍රමාණය ඇතුළත් වන දිස්ත්‍රික්ක 22 ක වර්ගීකරණය හා කෘෂි පරිසරික වර්ගීකරණ 07 උපයෝගී කරගෙන මෙවැනි ස්තර 64 පිළියෙල කරගත්තා. මෙම ස්ථරයකට ඇතුළත් කළහැකි ගම් වලින් පමණක්, එක් එක් ස්තරයෙන් සසම්භාවිව ගම් පිළිබඳ 2% ක සමූහයක් තෝරා, තෝරා ගත් එක් එක් ගමකින්ද, එම පදනම මතම ගොවි පවුල් පහක් තෝරාගෙන තිබෙනවා. මේ අනුව සමීක්ෂණය සඳහා ගොවි පවුල් තෝරාගෙන ඇත්තේ මුළුමනින්ම විද්‍යාත්මක පදනමක් මතයි. මේ අන්දමට 1978 යලේදී ගම් 376 ක ගොවි පවුල් 1,880 ක් සමීක්ෂණයට භාජනය කරල තියෙනවා. 1978/79 මහ කන්නයේදී යම් යම් සංශෝධනයන් සහිතව ගම් 384 ක ගොවි

පවුල් 1,916 ක ප්‍රමාණයක් සමීක්ෂණයට භාජනය වෙනවා.

ජාතික ගොවිකටයුතු නියැදි සමීක්ෂණවල පරමාර්ථය වන්නේ කෘෂිකාර්මික වැඩසටහන් සක්සේරු කිරීමේදීත්, සැළසුම් කිරීමේදීත් රජයට ප්‍රයෝජනවත් වන සවිස්තර තොරතුරු රැස් කර ගැනීමයි.

## සමාජ තොරතුරු

මේ කාර්යයේදී ගොවි පවුල් සමූහයක් වගා කන්නයක් තුළ නොකඩවා විමර්ශනයට ලක් කරමින් ගොවිකටයුතු රටාව, වගා පිළිවෙත්, සම්පත් භාවිතා කිරීම, වියදම හා නිමැවුම, නිෂ්පාදන අලෙවිය හා ණය භාවිතය, ගොවි පවුල්වල වගා හා ගොවි ගැටළු, ප්‍රජා විද්‍යා ලක්ෂණ, ලබා ගත හැකි ශ්‍රමය, ගොවිපලත් ඉන් පිටතත් සේවා අවස්ථා ආදිය පිළිබඳ සමාජ-ආර්ථික තොරතුරු රැස් කිරීම සම්බන්ධයෙන් වැඩි සැළකිල්ලක් දක්වනවා.

මෙසේ ඉතා ප්‍රයෝජනවත් තොරතුරු ලබා ගැනීමේ ලා පවතින දුෂ්කරතාවය ඉවත් කරලීමේ පියවරක් වශයෙනුයි, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මෙවැනි දීප ව්‍යාප්ත සමීක්ෂණයක් දියත් කරලීමට අරමුණ කරන ලද්දේ.

නියමු පදනමක් මත 1978 ජූනි මස 12 වෙනි දින ආරම්භ වුන මෙම ජාතික ගොවිකටයුතු නියැදි සමීක්ෂණ කටයුතු පුරා මාස 41/2 ක කාලයක් තුළ සිදු කොට තිබෙනවා. 1978/79 මහ සමීක්ෂණයේ විමර්ශන කටයුතු දැනටමත් ආරම්භ කරල. මේ අනුව නියමු අධ්‍යයනය වසරක් සම්පූර්ණ කරනවා. ඉන් අනතුරුව නොකඩවා කරගෙන යන සමීක්ෂණ ගණනාවක මුල් සමීක්ෂණය මෙයයි. මෙයින් ලබා ගන්නා අත්දැකීම් පසුව කෙරෙන අධ්‍යයන සැලසුම් කිරීම සඳහා උපයෝගී කර ගන්නවා.

## සහාය

මෙම සමීක්ෂණයේදී ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්ත-මේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේද සහයෝගය ලැබෙන බව මතක් කරදිය යුතුයි. මේ අතර ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සම්බන්ධීකරණ සංවිධානය ලෙස කටයුතු කරනවා.

දිස්ත්‍රික්ක වලට අනුයුක්ත කර ඇති ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරීන් මගින් දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර කටයුතු සම්බන්ධීකරණය කෙරෙනවා. විමර්ශන කටයුතුවල ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන විමර්ශකයන්ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආර්ථික සහායකයින්ද, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ විමර්ශකයින්ද යෙදී සිටිනවා. මේ සමීක්ෂණයේදී විශේෂ ලක්ෂණයක් ලෙස හඳුන්වා දුන් ප්‍රවෘත්ති සේවාව මෙහිදී අමතක නොකළ යුතුයි. මින් අරමුණු කරනුයේ කන්නය තුළ වගා කටයුතු පහසු කළ හැකිවනු වස් කලට වේලාවට නිසි පිළියම් යෙදීම සඳහා අදාළ ප්‍රදේශය තුළ නිෂ්පාදනය හා අලෙවි සම්බන්ධයෙන් විමර්ශකයින් විසින් රැස් කර ගනු ලබන ගැටළු පිළිබඳ තොරතුරු ඒ හා සම්බන්ධිත ආයතනවලට ඉක්මන් විසඳුම් ගැනීම සඳහා යොමු කරලීමයි. මුලදී මෙම ගැටළු ක්‍රියාත්මක ආයතනයේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට කෙලින්ම යොමු කිරීමට අදහස් කළත්, මෙම අරමුණ ක්‍රියාත්මක කළහැකි යෝග්‍ය යන්ත්‍රණයක් මේ මට්ටමේ නොමැති කමේ හේතුවෙන් දිස්ත්‍රික්කය භාර දිසාපති වරයාට පිටපතක් සහිතව ප්‍රදේශයේ උප දිසාපති වරයාට ඒවා යොමු කිරීමට සිදු වුනා. එහෙත් දිස්ත්‍රික් කෘෂිකාර්මික සේවා කමිටු පිහිටු වීමෙන් අනතුරුව කෙලින්ම මෙම ගැටළු එම ආයතන වෙත යොමු කිරීමට අදහස් කරනවා. මෙසේ යොමු කරනු ලබනු ගැටළු වගා කන්නය හා අදාල වන ගැටළු පමණක් බව මතක් කර දීම සුදුසුයි කියලා හිතනවා.

යල සමීක්ෂණයේ ප්‍රගතිය කෙරේ අවධානය යොමු කිරීමේදී දිවයින පුරා යල සමීක්ෂණයට භාජනය වූ ගොවි මහතුන්ගෙන් ලැබුන සහ-යෝගය අමතක කළ යුතු නැහැ. එමෙන්ම මහ සමීක්ෂණයේ සාර්ථකත්වය තීරණය වනුයේද ඔවුන්ගෙන් ලැබෙන සහයෝගය මත බව අපි විශ්වාස කරනවා.